# මීගමුව අධ්‍යාපන කලාපය
# දෙවන වාර ඇගයීම-2025
# පුරවැසි අධ්‍යාපනය

විභාග අංකය / නම : ..................................................................................................................

| 10 ශ්‍රේණිය | I හා II පත්‍රය | කාලය පැය 03 |
|---|---|---|

## I පත්‍රය

❖ **I පත්‍රයේ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(1) ප්‍රජාතන්ත්‍රවාදය යනු සියලු දෙනාටම අයිතිවාසිකම් හිමිවන පාලන ක්‍රමයකි. මෙම නිර්වචනය ඉදිරිපත් කරන ලද්දේ.
(i) ඒබ්‍රහම් ලින්කන් විසිනි. (ii) මහාචාර්ය ගානර් විසිනි.
(iii) සීලර් විසිනි. (iv) චාර්ල්ස් ඒ එල්වුඩ් විසිනි.

(2) තීන්දු ගැනීමේ ක්‍රියාවලියට සියලු දෙනාම සම්බන්ධ වීම අර්ථ දැක්විය හැක්කේ,
(i) වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදය ලෙස ය.
(ii) නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය ලෙස ය.
(iii) මහජන ප්‍රජාතන්ත්‍රවාදය ලෙස ය.
(iv) ඍජු ප්‍රජාතන්ත්‍රවාදය ලෙස ය.

(3) ප්‍රජාතන්‍ත්‍රවාදය ගොඩ නැගීමේ ප්‍රධාන කුලුනක් ලෙස සලකන්නේ,
(i) ව්‍යවස්ථාදායකය යි.
(ii) ආණ්ඩුව යි.
(iii) විධායකය යි.
(iv) අධිකරණය යි.

(4) රටක නීතිය ක්‍රියාවට නංවන ආයතනය වන්නේ,
(i) විධායකය යි. (ii) අධිකරණය යි.
(iii) ව්‍යවස්ථාදායකය යි. (iv) පොලීසිය යි.

(5) වර්තමාන ලෝකයේ බොහෝ රටවල් පාලනය සඳහා යොදා ගෙන ඇත්තේ,
(i) රාජාණ්ඩු පාලන ක්‍රමය යි. (ii) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය යි.
(iii) රදල පාලන ක්‍රමය යි (iv) සමූහාණ්ඩු පාලන ක්‍රමය යි.

(6) රාජ්‍යයකට පැවරෙන ප්‍රධාන කාර්යයක් නොවන්නේ,
(i) නීතිය සහ සාමය ආරක්ෂා කිරීමයි.
(ii) ආර්ථික හා දේශපාලන ස්ථාවරත්වය.
(iii) පොදු සේවා පවත්වා ගැනීම යි.
(iv) ආයතනයක වැටුප් ගෙවීම.

(7) ශ්‍රී ලංකාවේ පළාත් ගණන හා මැතිවරණ දිස්ත්‍රික්ක ගණන පිළිවෙලින් දක්වා ඇත්තේ,
(i) 08 , 25 යි. (ii) 09 , 25 යි.
(iii) 09 , 22 යි (iv) 08 , 22 යි.

(8) ද්වි පක්ෂ ක්‍රමයක් ක්‍රියාත්මක වන රටකට උදාහරණයකි,

(i) ශ්‍රී ලංකාව (ii) ඉන්දියාව

(iii) මහා බ්‍රිතාන්‍යය (iv) චීනය

(9) නිදහස් මාධ්‍ය මඟින් ඉටුකළ යුතු කාර්යභාරයක් නොවන්නේ,

(i) සත්‍ය හා නිවැරදි තොරතුරු ජනතාවට සැපයීම.

(ii) ජනතාවගේ දැනුම වර්ධනය කිරීම.

(iii) රජයට පක්ෂපාතීවන ආකාරයෙන් තොරතුරු ප්‍රචාරණය කිරීම.

(iv) කාලීන තොරතුරු ජනතාවට සැපයීම.

(10) ශ්‍රී ලංකාව සබරගමු පළාතට අයත් දිස්ත්‍රික්ක දෙක වනුයේ,

(i) කෑගල්ල, කුරුණෑගල (ii) කෑගල්ල, රත්නපුර

(iii) රත්නපුර, මහනුවර (iv) බදුල්ල, මොණරාගල

(11) ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මක වන පක්ෂ ක්‍රමය වන්නේ,

(i) බහු පක්ෂ ක්‍රමය යි. (ii) ඒක පක්ෂ ක්‍රමය යි.

(iii) ද්වි පක්ෂ ක්‍රමය යි. (iv) ජාතිවාදී පක්ෂ ක්‍රමය යි.

(12) පුරවැසියා හා බැඳුණු සාදාචාරාත්මක යුතුකමකි,

(i) පවතින නීතියට ගරු කිරීම.

(ii) රජයට නියමිත බදු ගෙවීම.

(iii) වැඩිහිටියන්ට ගරු කිරීම.

(iv) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කිරීම.

(13) එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය සම්මත කරනු ලැබුවේ.

(i) 1948 දෙසැම්බර් 10 (ii) 1949 දෙසැම්බර් 10

(iii) 1948 ඔක්තෝම්බර් 10 (iv) 1949 ඔක්තෝම්බර් 10

(14) රාජ්‍යයක මූලික ලක්ෂණ නිවැරදිව දක්වා ඇති වරණය තෝරන්න.

(i) නිශ්චිත භූමිය, අධිකරණය, ජනගහණය, ස්වාධිපත්‍යය

(ii) නිශ්චිත භූමිය, ජනගහණය, අධිකරණය, ආණ්ඩුව

(iii) නිශ්චිත භූමිය, ජනගහණය, ආණ්ඩුව, ස්වාධිපත්‍යය

(iv) ආණ්ඩුව, ජනගහණය, විධායකය, ව්‍යවස්ථාදායකය

(15) නියෝජ්‍ය ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කරන ඇතැම් රටවල් පාලන කටයුතු වලදී ඍජුවම ඡන්ද දායකයන්ගේ අදහස් විමසීමට ලක්කරන අවස්ථාවක් වන්නේ,

(i) මහ මැතිවරණය යි. (ii) ඡන්දය ප්‍රකාශ කිරීම යි.

(iii) ජනාධිපතිවරණය යි. (iv) ජනමතවිචාරණය යි.

(16) රජ්‍යයේ කැමැත්ත හා මහජන අපේක්ෂා ප්‍රායෝගික වශයෙන් ක්‍රියාවට නංවන නියෝජිතයා වන්නේ,

(i) අධිකරණය යි.
(ii) මන්ත්‍රීවරයා යි.
(iii) ජනාධිපතිවරයා යි.
(iv) ආණ්ඩුවයි.

(17) තල දෙකක ආණ්ඩු ක්‍රියාත්මක වන පාලන ක්‍රමය සහිත රාජ්‍යය හඳුන්වන්නේ,

(i) ඒකීය රාජ්‍ය ලෙසය.
(ii) ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය ලෙසය.
(iii) සන්ධීය රාජ්‍ය ලෙසය.
(iv) ජාතික රාජ්‍ය ලෙසය.

(18) ජනවර්ග, කුලය, භාෂාව හා ආගම, ස්ත්‍රී පුරුෂභාවය ආදී කිසිදු විශේෂීකරණයකට ලක් නොවන ලෙස නීතිය ක්‍රියාත්මක වීම හඳුන්වන්නේ,

(i) නීතිය ඉදිරියේ සාමානාත්මතාවය ලෙස ය.
(ii) ප්‍රජාතන්ත්‍රවාදී දිවිපැවැත්ම ලෙස ය.
(iii) අධිකරණයේ ස්වාධිනත්වය ලෙස ය.
(iv) සාමකාමී ආණ්ඩුකරණය ලෙස ය.

(19) පහත දැක්වෙන කරුණු අතුරෙන් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක ලක්ෂණ නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.

(A) විධායකය ව්‍යවස්ථාදායකයෙන් තේරීපත් වේ.
(B) විධායකය ව්‍යවස්ථාදායකයට වග කීමට බැඳී ඇත.
(C) විධායකය ඉවත් කිරීමට ව්‍යස්ථාවාදයකට හැකියාව ඇත.
(D) විධායකය අංග දෙකකින් සමන්විත වේ.

(i) A , B , C ය
(ii) A , C , D ය
(iii) A , B . D ය
(iv) B , C , D ය

(20) ඒකීය ආණ්ඩුක්‍රමයක් පවතින රාජ්‍යයක් නොවන්නේ,

(i) ශ්‍රී ලංකාව යි.
(ii) මහා බ්‍රිතාන්‍යය යි.
(iii) ආමරිකා එක්සත් ජනපයදය යි.
(iv) ප්‍රංශය යි

(21) ''ප්‍රීතිමත් හා ගෞරවාන්විත ජීවිතයක් ගත කිරීමේ අරමුණින් මිනිසුන් එකට එක් වී පිහිටුවාගත් සංවිධානය රාජ්‍ය වේ'' ඉහත නිර්වචනය ඉදිරිපත් කරන ලද්දේ,

(i) ඇරිස්ටෝටල් විසිනි
(ii) සීලර් විසිනි
(iii) ඒබ්‍රහම් ලින්කන් විසිනි
(iv) මහාචාර්ය ඒ.වී. ඩයිසි විසිනි

(22) රට තුල ක්‍රියාත්මක වන ප්‍රාන්ත ආණ්ඩු කැන්ටන් ලෙස හඳුන්වන්නේ,

(i) ප්‍රංශයේ ය.
(ii) ස්විස්ටරලන්තයේ ය.
(iii) ඉන්දියාවේ ය.
(iv) ඇමරිකා එක්සත් ජනපදයේ ය.

(23) ශ්‍රී ලංකාවේ පළාත් සභා පිහිටුවනු ලැබුවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ,

(i) 13 වන සංශෝධනයට අනුවයි.

(ii) 15 වන සංශෝධනයට අනුවයි.

(iii) 19 වන සංශෝධනයට අනුවයි.

(iv) 07 වන සංශෝධනයට අනුවය

(24) වෙනස්කම් තුලින් එකමුතුබව යන තේමාව ඔස්සේ බහු සංස්කෘතිකභාවය හොඳින් ප්‍රයෝජනයට ගෙන සංවර්ධන ඉලක්ක සපුරා ගත් රටකි.

(i) මහා බ්‍රිතාන්‍යය (ii) ශ්‍රී ලංකාව

(iii) මාල දිවයින (iv) සිංගප්පූරුව

(25) බ්‍රිතාන්‍ය පාලන සමයේ ආර්ථික භෝග වගාවන් සඳහා ශ්‍රමිකයන් ගෙන්වා ගන්නා ලද්දේ,

(i) පකිස්ථානයෙනි. (ii) අප්‍රිකාවෙනි.

(iii) දකුණු ඉන්දියාවෙනි. (iv) මහා බ්‍රිතාන්‍යයෙනි.

(26) නූතන ජාතික රාජ්‍යය සංකල්පයේ පදනම වන්නේ,

(i) එක් ජාතියක් එක් රාජ්‍යයක් යන්නයි.

(ii) එක් ජාතියක් එක් ආගමක් යන්නයි.

(iii) ප්‍රජාතන්ත්‍රවාදී සංකල්පයයි.

(iv) නීතියේ අධිපතිබවයි.

(27) පළාත් ආණ්ඩුකාරවරයා පත් කරනු ලබන්නේ,

(i) මහජනතාව විසින් ය. (ii) ජනාධිපතිවරයා විසින් ය.

(iii) කථා නායකවරයා විසින් ය. (iv) මහ ඇමති විසින් ය.

(28) ශ්‍රී ලංකාවේ පළාත් සභාවක නිල කාලය,

(i) වසර 04 කි. (ii) වසර 06 කි.

(iii) වසර 03 කි. (iv) වසර 05 කි.

(29) සංස්කෘතිය පිළිබඳ නිර්වචන ඉදිරිපත් කළ පුද්ගලයෙකි,

(i) ඇරිස්ටෝටල් (ii) ටී.බී. ටයිලර්

(iii) ඒබ්‍රහම් ලින්කන් (iv) සීලර්

(30) ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් වැඩිම ප්‍රමාණයක් සිටින ජනවර්ගය ප්‍රතිශතයක් ලෙස දැක් වූ විට එම අගය,

(i) 68.9% කි. (ii) 74.9% කි. (iii) 90.2% කි. (iv) 70.2% කි.

(31) පරාමාධිපත්‍ය බලයට අයත් වන ප්‍රධාන අංගයක් නොවන්නේ,

(i) නිදහස යි. (ii) මූලික අයිතිවාසිකම් ය.

(iii) පාලන බලතල යි. (iv) ඡන්ද බලය යයි.

(32) පළාත් පාලන ආයතනයක ප්‍රතිපත්ති සම්පාදනය කරන ආයතනය හඳුන්වන්නේ,

(i) මහා සභාව ලෙසය. (ii) නගර සභාව ලෙසය.

(iii) ව්‍යවස්ථාදායක සභාව ලෙසය. (iv) කාරක සභාව ලෙසය.

(33) ශ්‍රී ලංකාවේ ජනගහණයෙන් දෙවනුවට වැඩිම පිරිසක් අදහන ආගම වන්නේ,

(i) ක්‍රිස්තියානි ආගමයි, (ii) ඉස්ලාම් ආගමයි.

(iii) බෞද්ධ ආගමයි. (iv) හින්දු ආගමයි.

(34) රාජාණ්ඩු ක්‍රමය වෙනුවට පාලන කටයුතු සම්බන්ධයෙන් ජනතා නියෝජිතයන්ගේ බලය ඉස්මතු වූ අවස්ථාවක් වන්නේ,

(i) කාර්මික විප්ලවය යි.

(ii) පුනරුදය යි.

(iii) ඉංග්‍රීසි විප්ලවය යි.

(iv) රෙපරමාදු ආගමික ප්‍රතිසංස්කරණයි.

(35) මධ්‍යම ආණ්ඩුව විසින් ක්‍රියාවට නංවනු ලබන බලගත සඳහන් කර ඇති ලැයිස්තුව වන්නේ,

(i) I වන ලැයිස්තුවයි. (ii) සංවෘත ලැයිස්තුවයි.

(iii) ආවෘත ලැයිස්තුවයි. (iv) සමගාමී ලැයිස්තුවයි.

(36) ඇමරිකා එක්සත් ජනපදයේ වර්තමානයේ ප්‍රාන්ත සංඛ්‍යාව වන්නේ,

(i) 13 කි (ii) 50 කි (iii) 28 කි (iv) 100 කි

(37) ස්විස්ටර්ලන්තයේ බලතල ක්‍රියාවට නැංවීමේදී ගැටලුකාරී තත්ත්වයක් ඇති වුවහොත් එය විසඳීමේ බලය ඇත්තේ,

(i) සන්ධීය මහා මණ්ඩලයට යි. (ii) සන්ධීය සභාවට යි.

(iii) ශ්‍රේෂ්ඨාධිකරණයට යි. (iv) ජාතික සභාවට යි.

(38) ඇමරිකාවේ මධ්‍යම ආණ්ඩුව සතු බලතලයක් නොවන්නේ,

(i) බදු පැනවීම යි. (ii) නිවාස ඉදිකිරීම යි.

(iii) ජාතික ආරක්ෂාව යි. (iv) මූල්‍ය කටයුතු යි.

(39) ශ්‍රී ලංකාවේ පවතින පළාත් පාලන ආයතන වර්ගයකි.

(i) ගම් සභාව (ii) රට සභාව

(iii) පුරවැසි සභාව (iv) ප්‍රාදේශීය සභාව

(40) බලය විමධ්‍යගත කිරීම සඳහා දේශපාලන අධිකාරී ක්‍රමය ස්ථාපිත කරනු ලැබූ වර්ෂය වනුයේ,

(i) 1935 (ii) 1997

(iii) 1973 (iv) 1978

(ලකුණු 1 x 40 = 40)

## II - කොටස

- ❖ පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- ❖ පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න. පිළිතුරු ලිවිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 05 කි.

---

(1)

(i) නියෝජිතියන් තෝරා පත්කර ගැනීම සඳහා වර්තමානයේ දී බහුල වශයෙන් අනුගමනය කරනු ලබන නියෝජන ක්‍රම දෙක නම් කරන්න.

(ii) ශ්‍රී ලකාවේ ඡන්ද කොට්ඨාස බෙදා වෙන් කිරීම සඳහා යොදා ගන්නා ප්‍රධාන නිර්ණායක දෙක නම් කරන්න.

(iii) යුරෝපයේ බිහි වූ ප්‍රථම ජාතික රාජ්‍ය දෙක නම් කරන්න.

(iv) ජනාධිපති ආණ්ඩුක්‍රමයක ප්‍රධාන ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

(v) ඇමරිකානු කොංග්‍රස් මණ්ඩලය සමන්විත වන අයාතන දෙක නම් කරන්න.

(vi) ජාතික රාජ්‍ය පිළිබඳ සංකල්පය ශක්තිමත් කිරීමට අවශ්‍ය දේශපාලනික අදහස් ඉදිරිපත් කළ චින්තකයන් දෙදෙනෙක් නම් කරන්න.

(vii) සංස්කෘතියට අයත් අංග දෙකක් සඳහන් කරන්න.

(viii) ආණ්ඩුව සමන්විත වන ප්‍රධාන අංග දෙකක් ලියන්න.

(ix) පළාත් ආණ්ඩුකාරවරයා සතු බලතල හා කාර්යන් දෙකක් ලියන්න.

(x) ඉතා සංකීර්ණ බහු සංස්කෘතියක් පවතින රටවල් දෙකක් ලියන්න.

(ලකුණු 2 x 10 = 20)

(2) ඍජුව හෝ වක්‍ර අන්දමින් පාලන කටයුතු සඳහා ජනතාවට සහභාගී වීමට ඉඩ ලැබෙන පාලන ක්‍රමයක් ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් ලෙස හැඳින්වේ.

(i) ග්‍රීසියේ ඇතැන්ස් පෞර රාජ්‍යයේ පැවති පාලන ක්‍රමයේ මූලික ලක්ෂණ දෙකක් ලියන්න. (ල. 02)

(ii) ඍජු ප්‍රජාතන්ත්‍රවාදය වර්තමානයේ ක්‍රියාත්මක වීමේදී මතුවන ගැටලු තුනක් සඳහන් කරන්න. (ල. 03)

(iii) (a) ප්‍රජාත්නත්‍රවාදී පාලන ක්‍රමයක් සාර්ථක වීමට අවශ්‍ය සාධක තුනක් සඳහන් කරන්න. (ල. 03)

(b) ඉන් එක් සාධකයක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 02)

(3) ප්‍රජාතන්ත්‍රවාදයේ පැවැත්ම සඳහා 'මැතිවරණ' අත්‍යවශ්‍ය සාධකයක් වේ.

(i) ශ්‍රී ලංකාවේ ඡන්ද දායකයන්ට ඡන්දය පාවිච්චි කිරීමට ලැබෙන මැතිවරණ දෙකක් සඳහන් කරන්න. (ල. 02)

(ii) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් පවතින රටක ඡන්ද දායකයෙකු සතු අයිතිවාසිකම් තුනක් සඳහන් කරන්න. (ල. 03)

(iii) (a) නිදහස් හා සාධාරණ මැතිවරනයක ප්‍රධාන ලක්ෂණ 03 සඳහන් කරන්න. (ල. 03)

(b) ඉන් එක් ලක්ෂණයක් විස්තර කරන්න. (ල. 02)

(4) දේශපාලන සංවිධානයක් ලෙස ජාතික රාජ්‍යය යුරෝපයේ ස්ථාපිත වන්නේ 15 වන සියවසින් පසුවය.

(i) යුරෝපය තුල ප්‍රබලව නැගී සිටි ජාතික රාජ්‍යයන් දෙකක් සඳහන් කරන්න. (ල. 02)

(ii) ජාතික රාජ්‍ය බිහි වීමට බලපාන ලද හේතු තුනක් සඳහන් කරන්න. (ල. 03)

(iii) (a) ජාතික රාජ්‍යයක ප්‍රධාන ලක්‍ෂණ තුනක් සඳහන් කරන්න. (ල. 03)

(b) ඉන් එක් ලක්‍ෂණයක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 02)

(5) මධ්‍යම ආණ්ඩුව සතු ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ බලතල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හරහා ප්‍රාදේශීය පාලන ඒකක වෙන පවරා ඇති රාජ්‍ය සන්ධීය රාජ්‍ය වේ.

(i) සන්ධීය රාජ්‍යයන් දෙකක් නම් කරන්න. (ල. 02)

(ii) සන්ධීය රාජ්‍යයක ලක්‍ෂණ තුනක් ලියන්න. (ල. 03)

(iii) (a) නූතන රාජ්‍යවල බලය බෙදා හැරීම බලපාන ප්‍රධාන හේතු තුනක් සඳහන් කරන්න. (ල. 03)

(b) ඉන් එක් හේතුවක් විස්තර කරන්න. (ල. 02)

(6) නූතන රාජ්‍යයක් සැම විටම උත්සහ ගන්නේ විවිධ සංස්කෘතික වෙනස්කම් මගින් එක් ජාතියක් ලෙස සංවර්ධනය කරා යෑමයි.

(i) බහු සංස්කෘතික සමාජයක යහපැවැත්ම සඳහා පුරවැසියන් විසින් ප්‍රගුණ කළ යුතු ගුණාංග දෙකක් සඳහන් කරන්න. (ල. 02)

(ii) බහු සංස්කෘතික සමාජයක මූලික ලක්‍ෂණ තුනක් ලියන්න. (ල. 03)

(iii) (a) ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් වීම කෙරෙහි බලපා ඇති සාධක තුනක් ලියන්න. (ල. 03)

(b) ඉන් එක් සාධකයක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 02)

(7) යහපාලනය යනු රාජ්‍ය ප්‍රතිපත්ති තීරණය කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියක් වන අතර ජනතා සුභසිද්ධිය උපරිම වන අයුරින් කටයුතු කිරීම දැකිය හැකියි.

(i) යහපාලන සංකල්පය හඳුන්වා දීමට මුල් වූ සමාජ සාධාරණත්වය බිඳ වැටීමට බලපෑ හේතු දෙකක් ලියන්න. (ල. 02)

(ii) යහපාලනයක මූලික ගුණාංග තුනක් සඳහන් කරන්න. (ල. 03)

(iii) (a) බහු සංස්කෘතික ජන සමාජයක යහපාලනය ක්‍රියාත්මක වීමෙන් ලැබෙන වාසි තුනක් සඳහන් කරන්න. (ල. 03)

(b) ඉන් එක් වාසියක් විස්තර කරන්න. (ල. 02)